

## මිනිස්කම පමණක්ම ඉපැයූ ඔහු ලොවට ආදර්ශයක්මැ යි

# පරා

ඔහු නමින් පරරාජසිංහම්ය. 1935 දෙසැ.16 වන දා ශ්‍රී ලංකාවේ නල්ලූර් නම් ප්‍රදේශයේ උපත ලැබීය. යාපනය හින්දු විද්‍යාලයයේ අධ්‍යාපනය හදාරා පසුව කොළඹ විශ්ව විද්‍යාලයට පැමිණ ගණිත සහ ආර්ථික විද්‍යා අංශයෙන් උසස් අධ්‍යාපනය හැදෑරූ ඔහු මේ සියළු තැන්හිදී පෙර ගමන් කරුවෙකු ලෙසින් නායකත්ය දැරූවද නිතර මුවගෙහි රැඳි මිතුරු දමේ අවිහිංසක, අව්‍යාජ සිනහව නම් මැකී නොගිය බව ඔහු මුණ ගැසුණු සෑම විටෙකම පසක් වූ කරුණකි. දැඩි සමාජ හැල හැප්පීම් වලදී ද ඔහු නොසැලී ඒවාට මුහුණ දුන්නේ ද ඒ අව්‍යාජ සිනහවෙන්ම ය.

කවිරුත් ආදරයට ඔහු ඇමතුයේ 'පරා' නමිනි. පරා සතු වූ ඔහුගේ අනන්‍යතාව ද ඒ සිනහව බව නොකියාම බැරිය. සමාජයේ සිදු වන විවිධ අකටයුතුකම් වෙනුවෙන් මිනිසෙකුට තම පරිසරය තුළ දී කළ හැකි වූ සියල්ල ඉටු කරන්නට ඔහු වෙහෙසුණු බව අපි දුටුවෙමු. මිනිස් අයිතිවාසිකම් රැක ගැනීම වෙනුවෙන් ඔහු තම ජීවිත කාලයම කැප කළ අතර ඉතා සරල ජීවිතයක් ගත කළ අයෙක් ද විය. ඔහු සැබවින්ම මානුෂික හිතවාදියෙකු විය. මෙවන් මිනිසුන් ගැන ලෝකයට යමක් කිව යුත්තේ ද එනිසාමය.

***<u>යුරෝපය පුරා සැරිසරමින් විවිධ සංවිධාන සහ කණ්ඩායම් සමඟ යුද්ධයෙන් තොර යහපත් ශ්‍රී ලංකාවක් ගොඩ නැගීමේ උදාරතර කාර්යයට සැබෑවටම දායක වූ අයෙක් ලෙස පරා පිළිබඳව ලියා තැබිය යුතුමය.</u>***

ඔහු මිය යන විට පවා ආර්ථිකමය වශයෙන් ධනවතෙකු නොවීය. එහෙත් එලෙස ධනවත් බොහෝ දෙනෙකුට වඩා ඔහු මනුස්සකමත්, බුද්ධියත් උපයා ගෙන තිබුණි. ඔහු දිනා ගත්තේ මිනිසුන්ය. ඔහුගේ බුද්ධියෙන් එල ලද්දේ ද මිනිසුන්ය. මේ පුංචි සටහන ද ඒ වෙනුවෙන්ම මිස වෙන කුමකටද?

ඔහු Ceylon Mercantile Union හි ප්‍රධාන ක්‍රියාකාරි නියමුවෙක්ව කටයුතු කර ඇති අතර විවිධ දේශපාලන නායකයින් ඇසුරු කරමින් තම සමාජ මෙහෙවරට උර දුන් ආකාරය පසු කලෙක දැන ගන්නට ලැබිණ. එම අත්දැකීම් වඩ වඩාත් උපයෝගී කර ගනිමින් ඔහු ක්‍රියා කල ආකාරය සැම විටම ආදර්ශයක් ගෙන දුන්නේ යැයි හඟිමි. අනවශ්‍ය ලෙස සමාජය තුළ කැපී පෙනෙන්නට හෝ අනවශ්‍ය ලෙස පෞද්ගලික ලාභ ප්‍රයෝජනයක් ගන්නට හෝ කිසිදු විටෙක උත්සාහ නොකළ ඔහු සැම විටම තමා සතුව තිබු දෙයක් සමාජය උදෙසා වැය කළේය.

පරා ගේ ජීවිතයේ සොඳුරුතම කඩඉම වසර 1966 දී මල්ලිකා ඔහුට හමු වීම යයි සිතමි. මිනිස් අයිතිවාසිකම් සුරැකීමේ සංවිධාන සමඟ එක්ව සිටි ඇය පරාට මුණ ගැසුණේ දෛවයේ හාස්කමකටම වන්නට ඇත. වසර විසි ගණනක් තිස්සේ පැවැතෙන කෲර යුද්ධයෙහි අමානුෂික මුහුණුවරත්, එයට පිළිතුර විය යුත්තේ පරා - මල්ලිකා වැනි පාලම් තැනීමත් හැර වෙන කුමක් ද? පසුකාලීනව අපි ඔවුනට සිහල - දමිළ පාලම යයි ඇමතු හැටි ද මේ මොහොතෙහි දී සිහි වේ.

එහෙත් 1983 දී අප ශ්‍රී ලාංකිකයින් බොහෝ දෙනෙකුට අත් වූ අවාසනාවන්ත ඉරණමට වන්දි ගෙවීම සඳහා ඔවුනට ද රට හැර ගොස් තම ජීවිත බේරා ගන්නටත්, ජීවිතය නැවත ගොඩ නගා ගන්නටත් සිදු වීම අහම්බයක් නොව, ජරාජීර්ණ වූ බලලෝභී දේශපාලනයේ එල විපාකයන්ය. ජර්මනිය, ස්ටුට්ගා(ර්)ට් නම් වූ නගරයට පැමිණි පරා, මල්ලිකා සහ දරුවන් දෙදෙනා ද නුහුරු නුපුරුදු දේශයට ශ්‍රී ලාංකිකත්වයේ සාම සළකුණ සනිටුහන් කළහ. ඉන්පසුව එහි සහ අවට රටවල ශ්‍රී ලාංකික සබඳතාවන් ගොඩ නගා ගනිමින් සහ වර්ධනය කර ගනිමින් තම මව් බිම වෙනුවෙන් යමක් කරන්නටත්, සාමය යළි ඇති කිරීම සඳහා සෑම විටෙකම උත්සාහ ගත් බවත් කීම මේ වන විට ලොව පුරා විසිරුණු සහෘද ජනතාව ට අරුමයක් නොවනු ඇත. යුරෝපය පුරා සැරිසරමින් විවිධ සංවිධාන සහ කණ්ඩායම් සමඟ යුද්ධයෙන් තොර යහපත් ශ්‍රී ලංකාවක් ගොඩ නැගීමේ උදාරතර කාර්යයට සැබෑවටම දායක වූ අයෙක් ලෙස පරා පිළිබඳව ලියා තැබිය යුතුමය.

දේශපාලනමය වශයෙන් පමණක් නොව සාහිත්‍යයට ද ඔහුගෙන් ඉටු වූ සේවය ඉමහත්ය. ජර්මනියට පැමිණ වසර කිහිපයකින් චින්තනය නම් වූ දමිළ සඟරාව ආරම්භ කළ අතර පසුව ෂක්නනසහ් කය්බඑයසචචම නම් දමිළ සාහිත්‍ය සංගමය පිහිටුවීමෙහිලා පුරෝගාමීව කටයුතු කළේය. සාමයෙන් පිරුණු ශ්‍රී ලංකාවක් දැකීමේ සැබෑ වුවමනාවකින් කටයුතු කළ පරා.. කලාවත්, දේශපාලනයත් සමබරව ගෙන ගිය අයුරු අපූරුය. ඔහු අතින් ලියැවුණු දෑ ද, ඔහු කැමරා ඇසින් දුටු දෑ ද අපමණය, සුන්දරය, තර්කානුකූලය. මිය යන මොහොත වන තුරු ද සරල. සැහැල්ලු ජීවිතයක් ගත කල ඔහු වෙනුවෙන් මම මෙසේ ලියා තබමි.

## පරා

දිරා යන සිරුරකට ලොබ බඳින සනෙහසින්
තණ පතක තුසර බිඳ වියැකෙනා හැටි බලන්
මුදු හැඟුම් ලොවට පෑ දයා ගුණ පොදි බැඳන්
දුකම දී ගියා නුඹ හිතවතුන් ලෙහි සොවින්

අනියතය පණ නල ද අනෙක් දෑ පරිද්දෙන්
විරසකව කුමට තව එය සොබා පරිද්දෙන්
ජීවිතේ කවියක් ව නුඹ ගැයූ පරිද්දෙන්
ඒ මගම යා හැකි ද නොවරදින පරිද්දෙන්

වසන්තය අහවරයි දැන් කියා
ගිමන් කල රහසේම පැමිණියා
සිසිරයේ හිම බිඳුව ඝන වුණා
නොකියාම හොර රහසෙ නුඹ ගියා

දැනෙන දුක කෙසේ වාවනු හැකී
සිනා මුව සදා වැසුණා සකී
සඳ දියව කඳුළු හෙළනා දැකී
පිපුණු මල සුවඳ ගෙන ගිය සකී

ලෙන්ගතු සිනාල පාමින් නිරතුරුව සිටී
සිය සගයින් ද ගෙන පෙරමග බැඳුණු හැටී
සාමයෙ තොරණ බඳිනට ගත් වෙහෙස දුටී
සැමරුම් තැබූගග අගයන්නට තරම් වටී

මල් යායක මල් පිපිලා තිබුණාට
සෙනෙහස නොලස කවදත් නුඹ පිදුවාට
මිනිසත්කමට නුඹ අරුතක් දුන්නාට
අදහම් කෝම නුඹ නැහැමයි කීවාට

කඳුලක් නැගෙයි නෙත බර වී නුඹ නමට
සුසුමක් නැගෙයි සිතුවිලි සිර වූ ලෙසට
පවනක් නොවෙයි දැන් සිසිලස නැති පවට
ආයෙත් නොඒවිද හනිකට පෙර ලෙසට

අදහන්නට බැරි සිතින්... පතමු නිවන් සුව!!

**තුෂාරි ප්‍රියංගිකා**

---

**ඇමරිකානු මහදැන මුත්තෙකුගේ හපන්කමක්**
(සීවලි එදිරිවීර)

ලෝකයේ සංවර්ධිත රටවල් අතර ඇමරිකාවට හිමි වන්නේ ඉහල තැනක්. රටක සංවර්ධනයට එම රටේ වෙසෙන ජනතාවගේ බුද්ධිමත් බවද වැදගත් සාධකයක් ලෙස සැලකිය හැකියි. මේ නිසා ඇමරිකාව වැඩිම බුද්ධිමතුන් පිරිසක් වෙසෙන රටක් ලෙසද සැලකීමේ වරදක් නැත.

එසේ වුවද ශ්‍රී ලංකාවේ ජන කථාවල සඳහන් වන මහදැනමුත්තා විසින් කරන ලද අමන මෝඩ ක්‍රියාවන්ට දෙවෙනි නොවන මෝඩ වැඩ කරන මිනිසුන් පිළිබඳවද ඉඳහිට හෝ ඇමරිකාවෙන් අසන්නට ලැබෙනවා.

මේ කථාවත් එවැනි මෝඩයෙකු ගේ ක්‍රියාවක් පිළිබඳවයි.

දිනක් වොෂිංටනයේ නිවසක ජීවත් වන 66 හැවිරිදි මහලු පුද්ගලයෙක් තම නිවසේ මිදුලේ නතර කර තිබූ ඔහුගේ වාහනයේ රෝද මාරු කිරීමට තීරණය කරල ඒ වැඩේ ආරම්භ කළා.

රෝද සවිකර තිබූ ඇණ මුරිච්චි එකින් එක ගැලෙව්වද එක මුරිච්චියක් ගැලවීමට ඔහු කොපමණ උත්සාහ කළත් බැරි වුණා. මේ නිසා ඒ වනවිට අධික කෝපයකින් පසුවූ ඔහු ඒ එකම ඇණය ගැලවීම සඳහා ඔහු සතුව තිබූ තුවක්කුව ගෙනවිත් ගලවා ගත නොහැකි මුරිච්චිය වෙත ඉලක්ක කොට වෙඩි තැබුවා. එම වෙඩිල්ලෙන් නිකුත් වූ උණ්ඩ රෝදය සවිකර ඇති ඇණයේ වැදී නැවත පසුපසට ගමන් කොට වෙඩි තැබූ තැනැත්තාගේ දෙපා තුවාල කරමින් ගමන් කර තිබුණා. ඉන් එක් උණ්ඩයක් ඔහුගේ බඩ ප්‍රදේශයේද වැදි තිබුණා.

ජීවිතයට හානිදායක දරුණු තුවාල සිදුවී නොතිබුනද ප්‍රතිකාර සඳහා ඔහු වහාම රෝහලකට ගෙන යන්නට සිදුවී තිබුණා.

සාහිත්‍යයේ වෙබ් කවුලුව
www.ketapathpawra.com

